# 17. නිහතමානී වෙමු

**කිතුනු දරුවන් ලෙස අප තුළ පැවතිය යුතු යහපත් ගුණාංග කිහිපයක් පසුගිය පාඩම්වල දී හඳුනා ගැනීමට අපි උත්සහ කළෙමු. ඒ දෙවියන් වහන්සේ කෙරෙහි අප විසින් පවත්වා ගත යුතු ඇදහිල්ල, කිතුනු අප තුළ පැවතිය යුතු ප්‍රේමය, කමාව හා අප ලබන ආසිරි වෙනුවෙන් තුති පිදීම වේ.**

**මෙම පාඩමෙන් අප අත් දකින්නට උත්සහ කරන්නේ කිතුනු අනුගාමිකයකු ලෙස පැවතිය යුතු ජේසුස් වහන්සේ විසින් ම අවධාරණය කළ නිහතමානී වීමේ කිතුනු ගුණාංගයේ වැදගත්කම ය.**

එක් ගවේෂණ කණ්ඩායමක් රථයක නැගී වනාන්තර පාරක ගමන් කළේ ය. රථය වේගයෙන් ඉදිරියට ඇදුන ද එකවර ම රථය නතර කිරීමට ඔවුන්ට සිදු විය. පාර හරහා විශාල ගසක් වැටී තිබුණි. එතැනින් කිසිවකුට යාමට හැකියාවක් නොලැබිණ. මෙය කපා ඉවත් කිරීමට ඔවුන් ළඟ උපකරණ ද නොතිබුණි. ගවේෂණ කණ්ඩායමේ නායකයා එම ගස කෙසේ හෝ කපා ඉවත් කර, පාරේ ගමනාගමනයට ඉඩ සලසන ලෙසට කෑගසමින් නියෝග කළේ ය. ගස ඔසවා ඉවත් කරන්නට ගවේෂණ නිළධාරින් උත්සාහ කරමින් සිටිය ද ගවේෂණ කණ්ඩායමේ නායකයා රථයේ වාඩි වී ඒ දෙස බලා සිටියේ ය. ඔහු කිසි උදව්වක් දෙන්නට ඉදිරිපත් නොවී ය. එවිට ම අසකු පිට නැගී යන කෙනෙක් ඒ අසලට පැමිණියේ ය. ඔහු දුටු ගවේෂණ කණ්ඩායමේ නායකයා, ඔහුට ද අශ්වයාගෙන් බැස තම ගවේෂණ නිළධාරීන්ට උපකාර කරන ලෙසට කෑගසමින් නියෝග කළේ ය. එවිට මුවින් කිසි වදනක් පිට නොකළ ඒ පුද්ගලයා අසු පිටින් බැස වහා ම ගොස් ගවේෂණ නිළධාරීන්ට උපකාර කළේ ය. එකමුතු ව ඔවුහු ඒ විශාල කඳ ඔසවා පාරෙන් ඉවත් කළ හ. එසැනෙන් ම උපකාර කළ පුද්ගලයා අශ්වයා පිට නැගී ගමන් කිරීම ඇරඹී ය. එවිට ම තවත් අසරුවෝ කීප දෙනෙක් පැමිණ එම පුද්ගලයා පිටුපස මහත් ගෞරවයකින් මෙන් ගමන් කරන්ට පටන් ගත් හ. ගවේෂණ කණ්ඩායමේ නායකයාට මෙය විශාල ප්‍රශ්නයක් විය. ඔහු වහා ම තම නිළධාරියෙක් යවමින් එක් අශ්වාරෝහකයකුගෙන් ඒ තමන් හට උපකාර කළ පුද්ගලයා කව්දැ යි විමසනු ලැබී ය. ඔවුන්ට එසේ උපකාර කරනු ලැබුවේ ඒ රටේ රජතුමා බව එම අශ්වාරෝහකයා පැවසී ය.

මෙය ඇසූ විට ගවේෂණ කණ්ඩායමේ නායකයාට බියක් හා ලැජ්ජාවක් දැනෙන්නට විය. ඔහුට කතා කරගත නොහැකි විය. ඔහුගේ මුහුණේ ඉරියව් පවා වෙනස් විය. රජතුමාට තිබූ නිහතමානීකම ගවේෂණ කණ්ඩායමේ නායකයා තුළ නොතිබුණි.


## නිහතමානීකම

**කිතුනුවන් විසින් තම ජීවිත තුළින් එළි දැක්විය යුතු වැදගත්ම ගුණාංගයකි.**

එය ජේසුස් වහන්සේ විසින් ද ආදර්ශයෙන් ම ගෙනහැර දැක්වූ ඉතා වටිනා ගුණාංගයක් හා චරිත ලක්ෂණයකි. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ගේ පාද සේදීමෙන් තම නිහතමානීකම පෙන්නුම් කළ සේක.

එහෙත් උන්වහන්සේ ජීවත් වූ සමාජයේ සිටි ඇතැම් අය තමා ධර්මිෂ්ට යැයි සිතා අන් අය හෙළා දැක්කා හ. පරිසිවරුන් වැනි ආගමික කණ්ඩායම් පවා ඒ සඳහා යොමු වූ බව දේව වචනය තුළින් පැහැදිලි වේ. විශේෂයෙන් ම අයකැමියන්, පව්කාර ස්ත්‍රීන්, අන්‍ය ජාතීන්, රෝගීන් වැනි අය එදා සමාජයෙන් ප්‍රතික්ෂේප වූ කණ්ඩායම් විය. අයකැමියන් වැනි අයට දේව මාළිගයේ නමස්කාරය පවා තහනම් විය. එහෙත් ඔවුහු හැකි සෑම විට ම ජේසුස් වහන්සේ වටා එක් රැස් වූහ. උන්වහන්සේ ඔවුන් පිළිගත් සේක. ඔවුන් සැමට ම දයානුකම්පාව දැක්වූ සේක.

තමන් ධර්මිෂ්ඨ යැයි සිතමින් උඩඟු වීම දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව ද තම පව් ගැන මනස්ථාපනය වෙමින් කළ කන්නලව්ව උන්වහන්සේ පිළිගන්න බව ද කියා දීමට ජේසුස් වහන්සේ පැවසූ පරිසිවරයා සහ අයකැමියා පිළිබඳ උපමා කතාව කදිම නිදසුනකි.



**එම උපමාවට අනුව,**

***යාච්ඤා කිරීමට දේව මාලිගාවට යන මිනිසුන් දෙදෙනා.***

ආගමික නායකයෙකි → එක් අයෙක් පරිසිවරයෙකි


↑ **මොහුගේ යැදුම තමා ගැන වර්ණනා කර ගන්නා උඩඟුකමේ යැදුමකි.**

අනෙක් තැනැත්තා අයකැමියෙකි ← රෝම අධිරාජ්‍යයා වෙනුවෙන් බදු අය කරන කෙනෙකි.

↑ **මොහුගේ යැදුම තම පව්කාරකම හා නොවටිනාකම දෙවියන් වහන්සේ ඉදිරියේ ගෙනහැර දක්වන යැදුමකි.**

**ජේසුස් වහන්සේ පැවසූ පරිදි දේව සබඳතාව ලබා ගෙදර ගියේ කවරෙක් ද?**
පරිසිවරයා ද ? අයකැමියා ද ? - **පරිසිවරයා නොව අයකැමියා ය.**

තමා ම උසස් කරගන්නා, හැම දෙනා ම පහත් කරනු ලැබේ.
මෙම උපමාවට අනුව තමා ම උසස් කරගත්තේ කවරෙක් ද ?
**පරිසිවරයා යි**




**ඒ කෙසේ ද ?**


**මා අන් මිනිසුන් මෙන්, වස්තුවට ආශා කරන, වංචනික, අයහපත් කෙනකු නොවන බව ඔහු පැවසී ය.**

එලෙස ම,

❊ "මම මේ අයකැමියා වැන්නෙක් නොවෙමි යි' ද
❊ සතියකට දෙවරක් උපවාස කරන බව ද
❊ උපයන දෙයින් දහයෙන් කොටස දෙන බව ද පවසමින්,

- ඔහු දෙවියන් වහන්සේ ඉදිරියේ තමා උසස් කර ගත්තේ ය
- තමාගේ ධර්මිෂ්ඨකම තමා ම ප්‍රකාශ කර ගත්තේ ය
- අන් අය හෙළා දැක්කේ ය.

තමා ම පහත් කර ගන්නා, උසස් කරනු ලැබේ
මෙම උපමාවේ තමා ම පහත් කර ගත්තේ කවරෙක් ද ?
**අයකැමියා ය**




**ඒ කෙසේ ද ?**

- ඔහු දේව මාලිගයේ ඈතින් සිට ගත්තේ ය
- ස්වර්ගය දෙස ඇස් ඔසවා බලන්නට වත් නො සිතුවේ ය
- තමාගේ පපුවට ගසා ගත්තේ ය.

එලෙස ම,
'දෙවියන් වහන්ස පව්කාර වූ මා හට කරුණා කළ මැනව' යි බැගෑපත් ව ආයාචනා කළේ ය. මෙසේ අයකැමියා,

වේදනාවෙන්
ලැජ්ජාවෙන්
බයාදුකමින්
පසුතැවීමෙන්
තමාව පහත් කර ගනිමින්
යටහත් පහත් බවින්

දෙවියන් වහන්සේ ඉදිරියේ සිටියේ ය. දෙවියන් වහන්සේ ඔහුගේ නිහතමානී බව නිසා ඔහුගේ අයැදුම පිළිගත් සේක.

| | | |
|---|---|---|
| *තමා පමණක් ධර්මිෂ්ඨ හා නිවැරදි බව සිතීම*<br>*තමාගේ හැකියාවන් ගැන වර්ණනා කිරීම*<br>*තමාට ඇති දේ ගැන උදම් ඇනීම*<br>*අන් අය හෙළා දැකීම*<br>*අන් අයගේ වැරදි ප්‍රසිද්ධියේ කියා ඔවුන්ට නින්දා කිරීම* | **සැ ම වි ට ම** | දේව දරුවන්ට නුසුදුසු යි. |
| ඒ වෙනුවට සැමවිට ම<br>*සිතුවිලිවලින්*<br>*කතා කරන වදන්වලින්*<br>*ක්‍රියාවෙන්* | **නි හ ත මා නී වීමට** | අපි උත්සාහ කරමු. |

**දෙවියන්වහන්සේ ඉදිරියේ අපගේ යැදුම්වල දී,**

- ❊ අපි පසුතැවිලි වූ හදකින් උන්වහන්සේ වෙත ළඟා වෙමු
- ❊ අපි කළ වැරදි සිහි කරමින් උන්වහන්සේගෙන් සමාව ලබමු
- ❊ උන්වහන්සේ පමණක් දැහැමි බව මතක තබා ගනිමින් එම දැහැමි බව අප ජීවිතවලට ද අයැද සිටිමු
- ❊ දෙවියන් වහන්සේ සමග නියම සබඳතාවයට අපි පත් වෙමු
- ❊ උන්වහන්සේගේ දයානුකම්පාවට අපි භාර වෙමු.

**එසේ කළහොත්,**
**අපගේ නිහතමානි යැදුම්වලට දෙවියන් වහන්සේ ප්‍රසන්න වන සේක.**

ජේසුස් වහන්සේ පැවසූ එම උපමාව මගින් අප ජීවිත සඳහා

පරිසිවරයාගෙන් ඉගෙන ගත හැකි පාඩම්
අයකැමියාගෙන් ඉගෙන ගත හැකි පාඩම්
ඔබට සටහන් කළ හැකි දැයි බලන්න.

එසේ ඉගෙන ගන්නා පාඩම් මගින්,

- ❊ නිවසේ දී කීකරු දරුවකු ලෙස නිහතමානී වීමට
- ❊ පාසලේ දී කීකරු දරුවකු ලෙස නිහතමානී වීමට
- ❊ සමාජයේ දී කීකරු පුරවැසියකු ලෙස නිහතමානී වීමට

ඔබට හැකියාව ලැබේ. නිහතමානීකම දුර්වලකමක් සේ නොසිතිය යුතු ය. අප නිහතමානි වෙමින් ම අසත්‍ය හා වංචාව ඉදිරියේ ශක්තිමත් ව නැගී සිටිය යුතු ය.

නිහතමානීකම දෙවියන් වහන්සේගේ දරුවන්ට අත්‍යවශ්‍ය ම ගුණාංගයක් ලෙස සිතා සැමවිට ම නිහතමානී වීමට අද දවසේ පටන් උත්සාහ කරන්න. දෙවියන් වහන්සේ ඔබට උපකාර කරනු නොඅනුමාන ය.

කටපාඩම්
කරමු.
ශු. ජොහාන් 13:14

ක්‍රියාකාරකම

1. දෙවිඳුන් ඉදිරියේ ඔබ නිහතමානී ව කරන යැදුමක් ලියා දක්වන්න.

2 පාසල් සිසුවකු ලෙස ඔබ,
දෙමාපියන් හා වැඩිහිටියන් ඉදිරියේ,
ගුරුවරුන් ඉදිරියේ,
මිතුරන් ඉදිරියේ,
නිහතමානී ව කටයුතු කරන ආකාර එක බැගින් ඉදිරිපත් කරන්න.